සිංහල අධ්‍යයනාංශය

ශාස්ත්‍ර පීඨය - කොළඹ විශ්වවිද්‍යාලය

**සිංහල ලේඛන කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

**හැඳින්වීම**

පාසල් ගුරුවරුන්ට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයයේ නියුතු අනෙකුත් වෘත්තිකයන්ගේ සිංහල ලේඛන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් සිංහල අධ්‍යයනාංශය තුන් මාසික සහතික පත්‍ර පාඨමාලාවක් හඳුන්වා දෙයි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන් ලෙස තම වෘත්තියට අදාළ සිංහල ලේඛනය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීමට උනන්දුවක් දක්වන අයට මේ සඳහා අයදුම් කළ හැකි ය. සාර්ථක ව මෙම පාඨමාලාව අවසන් කරන විද්‍යාර්ථීන් සඳහා සහතික පත්‍රයක් පිරිනැමේ.

**පාඨමාලා අරමුණ**

පාසල් ගුරුවරුන්ගේ සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවය කරන අනෙකුත් වෘත්තිකයන්ගේ සිංහල භාෂා දැනුම සහ ලේඛන කුසලතා වර්ධනය කිරීම ඔස්සේ නිවැරදි සිංහල භාෂා භාවිතය ප්‍රචලිත කිරීමත් ඔවුන්ගේ නිර්මාණශීලි සන්නිවේදන ශක්‍යතා ප්‍රවර්ධනය කිරීමත් මෙම සහතික පත්‍ර පාඨමාලාවේ අරමුණු වේ.

**ඉගෙනුම් ප්‍රතිඵල**

i. ලිඛිත සිංහල භාවිතයේ ප්‍රධාන ව්‍යාකරණ නීති සහ සම්මුතීන්වලට අදාළ ව පැහැදිලි ව දැනුම ලබා ගැනීමට සමත් වීම

ii. අධ්‍යයන, වෘත්තීය සහ අනෙකුත් ප්‍රායෝගික අරමුණු සඳහා නිරවද්‍ය ව සහ නිර්මාණශීලි ව ලිඛිත සිංහල භාවිත කිරීම තේරුම් ගැනීම

iii. ලිවීමේ ශිල්පීය ක්‍රම සහ ක්‍රියා පටිපාටි භාවිත කිරීමේ නිවැරදි ස්වරූපය, ශෛලිය සහ ව්‍යාකරණ නිවැරදි භාවිතය කෙරෙහි අවධානය යොමු කිරීම සහ රසවින්දනාත්මක අවකාශය භාවිත කිරීම

**ඉලක්ක කණ්ඩායම**

- පාසල් ගුරුවරු.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවය කරන අනෙකුත් වෘත්තිකයෝ

මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට කැමති අපේක්ෂකයන් අවම ප්‍රවේශ අවශ්‍යතාව ලෙස උසස් පෙළ විභාගය සමත් වී තිබිය යුතු ය.

**දේශක මණ්ඩලයඃ**

දේශන සහ වැඩමුළුවීම මෙහෙයවීම සිංහල අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් සිදු කෙරේ.

**උපදේශන මාධ්‍යය**

පාඨමාලා සඳහා උපදෙස් සහ දේශන සිංහල මාධ්‍යයෙන් සිදු කෙරේ.

**ඉගැන්වීමේ ක්‍රමවේදය**

දේශන¸ සාකච්ඡා සහ වැඩමුළු

**බෙදා හැරීමේ ආකාරය**

දෙමුහුම් ක්‍රමයට (මාර්ගත ව සහ සජීවි ව)

**පාඨමාලා ගාස්තුව**

රු. 26000.00 = (පාඨමාලා ගාස්තුව රු. 25000.00+ ලියාපදිංචි ගාස්තුව රු.1000.00) වාරික දෙකකින් ගෙවිය හැකි ය.

**පාඨමාලා කාලය**

මාස 3යි (සතියකට දින දෙකක් ප.ව. 04.00 සිට ප.ව. 06.00 දක්වා)

සතියේ දිනවල - ප.ව. 4.00- 6.00

ඉරිදා දිනවල - පෙ.ව. 10.00 - 12.00

**ඇගයීම් ක්‍රමවේදය**

සහතික පාඨමාලාව සඳහා ඇගයීම් පහත පරිදි වේ, මෙම පාඨමාලාවට අදාළ ව ඔබ පහත දැක්වෙන ආකාරයේ විභාග ප්‍රශ්නපත්‍ර හතරකට පිළිතුරු සැපයිය යුතු ය.

1. ප්‍රායෝගික ලේඛන සිංහලය
2. නිර්මාණාත්මක ලේඛනය
3. රචනය සහ සාරාංශය
4. සොඳුපත් කියවීම සහ සංස්කරණය

**ඇගයීම් ක්‍රමවේදය**

| | | |
|---|---|---|
| අඛණ්ඩ ඇගයීම | - | ලකුණු -50 |
| අවසන් ලිඛිත පරීක්ෂණය | - | ලකුණු -50 |

පාඨමාලාව සමත්වීමට නම් විභාග ප්‍රශ්නපත්‍ර හතරට ම සම්පූර්ණ ලකුණු 100න් අවම වශයෙන් ලකුණු 50ක් ලබාගත යුතු ය.

**පාඨමාලා අන්තර්ගතය**

- ලිවීමේ ක්‍රියාවලිය හැඳින්වීම
- සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හැඳින්වීම
- සිංහල ලිඛිත ව්‍යවහාරයේ සමකාලීන ගැටලු
- සිංහල හෝඩිය සහ අක්ෂර වින්‍යාස රීති
- සිංහල අක්ෂර වින්‍යාස දෝෂ
- සිංහල වාක්‍ය සාධන රීති
- කර්තෘකාරක කර්මකාරක වාක්‍ය
- ප්‍රකෘති විකෘති කථනය
- වචන වෙන් කිරීම සහ විරාම ලකුණු
- ලේඛන ප්‍රවර්ග
    - රාජකාරි /ව්‍යාපාරික ලිපි
    - නිල දැන්වීම්
    - වාක්‍ය රචනා
- ශාස්ත්‍රීය ලිපි
- රචනය සහ සාරාංශකරණය
- නිර්මාණාත්මක ලේඛනය
- සෝදුපත් කියවීම සහ සංස්කරණ ශිල්පීය ක්‍රම

**සහතික ප්‍රදානෝත්සවය සහ ප්‍රතිඵල නිකුත් කිරීම**

විභාගයෙන් මාස තුනකට පසු ප්‍රතිඵල නිකුත් කෙරේ.

ප්‍රතිඵල නිකුත් කිරීමෙන් මාසයක් ඇතුළත සහතික ප්‍රදානය කෙරේ.

**අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය**

අයදුම්පත් ගාස්තුව 304013700006 අංක දරන ගිණුමට බැර කර එහි ලදු පත සහ රාජකාරිය තහවුරු කිරීමේ ලිපිය ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂකයින්ට උදේ 9.00 සිට සවස 3.00 දක්වා සිංහල අධ්‍යයනාංශයෙන් පාඨමාලාවට අදාළ අයදුම්පත ලබාගත හැකි ය. 2025 දෙසැම්බර් 15 දිනට පෙර අයදුම්පත සිංහල අධ්‍යයනාංශය වෙත එවිය යුතුය.

**පාඨමාලා සම්බන්ධීකාරක**

ආචාර්ය ඩබ්ලිව්.එම්. කල්‍යාණි විජේසුන්දර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය